# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2022 සැප්තැම්බර් මස 23 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2022.09.27 දින නිකුත් කරන ලදී)**

## එකතු කළ අගය මත බදු (සංශෝධන)

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ
නියමය පරිදි පළකරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 15.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, සපයනු ලබන භාණ්ඩවල හෝ සේවාවල හෝ ආනයනය කරන භාණ්ඩවල වටිනාකම මත වන බදු අනුප්‍රමාණය-

(i) 2022 ජුනි මස 1 වන දින සිට 2022 අගෝස්තු මස 31 වන දින දක්වා බලාත්මක වන පරිදි 8% සිට 12% දක්වා වැඩි කිරීම ; සහ

(ii) 2022 සැප්තැම්බර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 12% සිට 15% දක්වා වැඩි කිරීම වේ.

***3 වන වගන්තිය :*** මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි වූ එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ, එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වීම සඳහා වන සීමාව, 2022 ඔක්තෝබර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි වාර්ෂිකව රුපියල් මිලියන තුන්සියයේ සිට රුපියල් මිලියන අසූව දක්වා අඩු කිරීම වේ.

***4 වන වගන්තිය :*** පදිංචිය සඳහා වන සහාධිපත්‍ය දේපළ සම්බන්ධයෙන් පවතින එකතු කළ අගය මත බද්දෙන් නිදහස් කිරීම, 2022 ඔක්තෝබර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි ඉවත් කිරීම සඳහා මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස සංශෝධනය කරනු ලැබේ.

එල්.ඩී.-ඕ. 16/2022

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2022 අංක    දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2002 අංක 14 දරන පනතේ 2 වන වගන්තිය සංශෝධනය කිරීම

**2.** (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (v) වන අයිතමයේ "අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/23 ක් වේ)." යන වචන සහ ඉලක්කම් වෙනුවට "අනුප්‍රමාණය මත (එහි බදු ඛණ්ඩය 3/23 ක් වේ);" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (vi) වන අයිතමයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන, එහෙත් 2022 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (vi) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:–

"(vii) 2022 ජූනි මස 1 වන දිනයෙන් ආරම්භව 2022 ජූනි මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සහ 2022 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භව එහෙත් 2022 අගෝස්තු මස 31

වන දිනෙන් අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/28 ක් වේ); සහ

(viii) 2022 සැප්තැම්බර් මස 1 වන දිනයෙන් ආරම්භව 2022 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සහ 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/23 ක් වේ).".

ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ, (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (vi) වන ඡේදයේ ''2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු'' යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු, එහෙත් 2022 සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) (vi) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(vii) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ශ්‍රී ලංකාව තුළ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරන හෝ කරගෙන යනු ලබන සෑම තැනැත්තකු ම-

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් බදු අය කළ හැකි මාස එකක හෝ මාස තුනක කාලසීමාව අවසානයේ දී, එම තැනැත්තාගේ එකී බදු අය කළ හැකි කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන විස්සක් හෝ ඊට වැඩි නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ එම

තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන අසූවක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) යම් අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඉදිරියේදී එළඹෙන බදු අය කළ හැකි මාස එකක හෝ මාස තුනක කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන විස්සක් ඉක්මවීමට ඉඩ ඇති බවට, හෝ ඉදිරියේ දී එළඹෙන මාස දොළහක කාලසීමාව තුළ දී රුපියල් මිලියන අසූවක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.".

**ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම**

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම කොටසේ (ආ) ඡේදයේ (xi) වන අයිතමයේ (ඈ) අනු අයිතමයේ "එම සැපයුම් 2019 දෙසැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව සිදු වී ඇත්නම්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම සැපයුම් 2019 දෙසැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙර සිදු වී ඇත්නම්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) (ආ) ඡේදයේ (xi) වන අයිතමයේ (ඈ) අනු අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(ඉ) එම සැපයුම 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසුව සිදුවී ඇත්නම්, යම් තැනැත්තකු විසින් කරනු ලබන පදිංචිය සඳහා වන නිවාස බදු දීමක් හෝ කුලියට දීමක් හෝ යම් පදිංචිය සඳහා වන සහාධිපත්‍ය දේපළ සැපයුමක් නොවන සැපයුම්.".

**5**. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව